## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මඩකලපු දිස්ත්‍රික්කයේ එරවිල් සහ දකුණු මන්මුනෙයි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසෙහි තෙට්ටාතිව් ගම්පති වසමෙහි, අංක දෙක දරන තෙට්ටාතිව් ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 23 ක් පමණ වූ, "පනිච්චයාඩිපල්ලම්" නමැති ඉඩමට මායිම් :—

උතුරට : පාර ; නැගෙනහිරට : සින්නතම්බි සින්නපිල්ලේ සහ ඇගේ පුරුෂයා වන කේ. පරමලිංගම් හිමිකම් කියන "පනිච්චයාදිපල්ලම්" නමැති ඉඩම ; දකුණට : කන්තප්පර් කදිරාමතම්බි අයිතිකම් කියන පනිච්චයාදිපල්ලම් නමැති ඉඩම ; බස්නාහිරට : වයිරමුත්තු තංගපිල්ලේ සහ සින්නතම්බි කන්තප්පන් අයිතිකම් කියන පනිච්චයාදිපල්ලම් නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 59/60 ඊ 671.

1962 මැයි මස 11 වැනි දින,
කොළඹ දීය.

6-322

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බටහිර නයිනමඩම ගම්මුලාදෑනි වස මේ බටහිර නයිනමඩම ගමේ පිහිටි පහත සඳහන් බිම් තීරු :—

**1. කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 112 අඩි 14 ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට : ඩබ්ලිව්. මකාරියෙස් තමෙල් අයිතිකම් කියන මිල්ල ගහඹිවිට නමැති ඉඩම සහ ඩබ්ලිව්. අයි. ඇස්. ප්‍රනාන්දු අයිතිකම් කියන මිල්ලගහඹිවිට නමැති ඉඩම ; නැගෙණහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට සහ බස්නාහිරට : දැනට පවත්නා අඩි පාර.

**2. කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 154 = අඩි 7 ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගේණහිරට : ඩබ්ලිව්. අයි. ඇස්. ප්‍රනාන්දු අයිතිකම් කියන රුක්අත්තන ගහ වත්ත නැමැති ඉඩම ; දකුණට : දැනට පවත්නා අඩි පාර ; බස්නාහිරට : මෙම ඉඩමේම රජය ගැනීමට අදහස් කරන කොටසක්.

**3. කෝන්ගහවත්ත නොහොත් තල්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 59 × අඩි 7 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට : දැනට පවත්නා අඩි පාර ; නැගෙණහිරට : ඩබ්ලිව්. ජෝකිහු තමෙල් අයිතිකම් කියන කෝන්ගහවත්ත නොහොත් තල්ගහවත්ත නමැති ඉඩම ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ඩබ්ලිව්. ඇම්. ඇග්නස් පීරිස් සහ ඩබ්ලිව්. සිරිල් තමෙල් අයිතිකම් කියන කෝන්ගහවත්ත නමැති ඉඩම.

**4. කෝන්ගහවත්ත නොහොත් තල්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 70 × අඩි 7 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට : දැනට පවත්නා අඩි පාර ; නැගෙණහිරට : ඩබ්ලිව්. ජෝසප් තමෙල් අයිතිකම් කියන කෝන්ගහවත්ත නොහොත් තල්ගහවත්ත නමැති ඉඩම ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ඩබ්ලිව්. ජොසපින් තමෙල් අයිතිකම් කියන කෝන්ගහ වත්ත නොහොත් තල්ගහ වත්ත නමැති ඉඩම.

**5. රුක්අත්තන ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 49 × අඩි 7 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට ඩබ්ලිව්. ඇම්. ඇග්නස් පීරිස් සහ තවත් අය අයිතිකම් කියන කෝන්ගහ වත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : ඩබ්ලිව්. ජෝන් බැප්ටිස් තිසේරා සහ තවත් අයෙක් අයිතිකම් කියන කොස්ගහ වත්ත නමැති ඉඩම ; බස්නාහිරට : දැනට පවත්නා අඩි පාර.

**6. කෝන්ගහවත්ත නොහොත් තල්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 244 × අඩි 7 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට සහ නැගෙණහිරට : දැනට පවත්නා අඩි පාර ; දකුණට : ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇල්ප්‍රඩ් ප්‍රනාන්දු අයිතිකම් කියන දම්නනගහ වත්ත නොහොත් රුක්අත්තනගහ වත්ත නමැති ඉඩම ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

**7. කොස්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 204 × අඩි 7 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :—**

උතුරට : ඩබ්ලිව්. අයි. ඇස්. ප්‍රනාන්දු අයිතිකම් කියන රුක්අත්තනගහ වත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට සහ බස්නාහිරට : දැනට පවත්නා අඩි පාර.

**8. දම්නනගහවත්ත නොහොත් රුක්අත්තනගහ වත්ත නමැති ඉඩමෙන් අඩි 250 × අඩි 4 පමණ ප්‍රමාණ බිම් තීරුවකට මායිම් :**

උතුරට : ඩබ්ලිව්. ජෝන් බැප්ටිස් තිසේරා සහ කේ. මර්තීනු පෙරේරා අයිතිකම් කියන කොස්ගහවත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : දැනට පවත්නා අඩි පාර.

**9. දම්නනගහවත්ත නොහොත් රුක්අත්තනගහ වත්ත නමැති ඉඩමෙන් අඩි 280 × අඩි 4 ප්‍රමාණ තීරුවකට මායිම් :—**

උතුරට සහ නැගෙණහිරට : දැනට පවත්නා අඩි පාර ; දකුණට : ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 60 - 61 එල්. ජී. 448 - ඇල්. ඒ. 3834.

1962 මැයි 3 දින කොළඹ දී ය.

6-396

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල කටයුතු අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාතේ කුන්චුට්ටු කෝරලේ කුඹුක්වැව ගම්මුලාදෑනි කොටසේ කොලිබැන්දව ගමේ පිහිටි පුරාණ වෙල නමැති ඉඩමෙන් අක්කර 24, රූඩ් 2, පර්චස් 0 පමණ ප්‍රමාණය.

එයට මායිම් :—

උතුරට : හැන්දගම මහ ඇල සහ හැන්දගම වැව්කන්ද ; නැගෙනහිරට : හැන්දගම වැව්කන්ද ; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි කටයුතු පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 56 එල් 355/එල්.ආර්. 1564.

1958 ජනවාරි මස 29 වැනි දින,
කොළඹදීය.

6-323

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අවුලුගම් පනාවල් දෙකෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාගල වසමේ දික්ඇල්ලකන්ද ගමේ පිහිටි අස්ගල්හේන නමැති ඉඩමෙන්, පහත සඳහන් මායිම්වලින් යුත් දම්වැල් 5 ක් පමණ දිග, අඩි 10ක් පමණ පළල බිම් කොටසක්.

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : පාසල් ඉඩම (කට්ටි අංක 203) ; දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ; බටහිරට : රජයේ කැලෑව.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 59/60 ඊ 302 කේ/එල් එම් 5848.

1962 මැයි මස 15 වෙනි දින,
කොළඹදීය.

6-367

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල්කෝරළේ මල්මඩුව ගම්මුලාදෑනි කොට්ඨාශයේ මල්මඩුව ගමේ පිහිටි මුළු ප්‍රමාණයෙන් පර්චස් 12.93ක් පමණ විශාල ගල්කොටුවේ වත්ත සහ වැලිගොඩේ පිල්ලෑව නමැති ඉඩම් කොටස් 3 කට මායිම් :—

**(1) ගල්කොටුවේ-පර්චස් 5.29 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට : ඇම්. ඒ. ඩිංගිරි බණ්ඩා සහ තවත් අය අයිතිකම් කියන ඇව්වත්ත නොහොත් ගොලුගේ වත්ත ; දකුණට : ඇම්. ඒ. ජයවර්ධන සහ තවත් අය අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් ; බස්නාහිරට : පී ඩිංගිරි අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන උනුවේ වෙල්යාය.

**(2) වැලිගොඩේ පිල්ලෑව-පර්චස් 1.76 ක් පමණ**

උතුරට : පී. ඩිංගිරි අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන උනුවේ කුඹුරේ ඉන්නියර ; නැගෙනහිරට : ඇම්. අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන මුහන්දිරමලාගේ ගල්කොටුවේ ඉවුර ; දකුණට : මල්මඩුව විහාරය අයිතිකම් කියන පින්කුඹුර ; බස්නාහිරට : වී. ආර්. පුංචිබණ්ඩා සහ තවත් අය අයිතිකම් කියන වැලිගොඩේ කුඹුර.

**(3) ගල්කොටුවේ වත්ත—පර්චස් 5.88 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට : ඇම්. අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන මදුරුසිංහ ආරච්චිල්ලාගේ වත්තේ ගල්වැට ; දකුණට : ඇම්. ඒ. කිරිබණ්ඩා සහ තවත් අය අයිතිකම් කියන මදුරුසිංහ ආරච්චිලාගේ කුඹුර ; බස්නාහිරට : ඇම්. අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන මුහන්දිරමලාගේ කුඹුරේ ඉම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 60/61 එල් 491.

1962 මැයි මස 15 දින,
කොළඹ දී ය.

6-320

---

අංකය : කිව්.ඩී. 80.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංකය ඒ. 4,883. ගම : දඩගමුව

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : බදුල්ලගහලන්ද ; විස්තර : අවු. 30 වැඩිවූ පොල් ගස් 10. අවු. 5—10 වූ පොල්ගස් 68, අවු. 10—15 වූ කොස්ගස් 9, අවු. 10—15 වූ අඹගස් 2, අවු. 15ක් වූ කජුගස් 2ක් සහ අවු. 10ක් වූ පුවක්ගස් ඇති ඉඩම ; අයිතිකම් කියන අය : ඇම්. එච්. හසීම්, නොයස් පාර, පුත්තලම සහ ඇම්. ජේ. අයි. හසීම්, දිනමිණ කාර්යාලය, කොළඹ ; ප්‍රමාණය : අ. 1, රූ. 0, පර්. 00.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ජූලි මස 18 වැනි දින පූ. භා. 10 ට කොළඹ, කච්චේරියේ දී මාසම්මුඛ විය යුතුයි.

තවද, 1962 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ටී. පත්මනාදන්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 මැයි 30 වැනි දින,
කොළඹ කච්චේරිය.

6—347

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය. කිව්.ඩී. 94.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංකය ඒ. 4,879. ගම : දඩුගමුව

**කැබැල්ල 1.**

ඉඩමේ නම : කලගහවත්ත නොහොත් මීල්ලගහවත්ත ; විස්තර ; වගා නැති ඉඩම ; අයිතිකම් කියන අය : නුගවෙල පතිරන්නැහෙලාගේ චාර්ලිස් සිංඤෝ, දඩගමුව, වේයන්ගොඩ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 4.44.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ජූලි මස 19 වැනි දින පූ. භා. 10 ට කොළඹ, කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 වූ ජූලි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. පත්මනාදන්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 මැයි 30 වැනි දින,
කොළඹ කච්චේරිය.

6—353

---

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත 460 වැනි පරිච්ඡේදය

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ආර්/කිව්. 310.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම ඒ. 4856 : පිහිටීම : කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනගේ කොට්ඨාශයේ කෝට්ටේ-ගල්කිස්ස ගම් කාර්ය සභාවේ සීමාව තුළ පිහිටි බොරලැස්ගමුව නමැති ගම.

**කැබැල්ල : 1.**

නම : දෙල්ගහවත්ත, වරිපනම් අංක 46, බොරලැස්ගමුව-හොරණ පාර ; විස්තරය : රබර්, රබර් ගස් 31, අවු. 25 ට වැඩි පොල්ගසක් සහ කජු ගසක් ; අයිතිකම් කියන අය : දොන් ඩේවිඩ් රූබේරු, කලටුවාව, වැවල ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 25.5.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ක්වූ අගෝස්තු මස 2 වෙනි දින පෙරවරු 10.30 වේලාවට කොළඹ, කච්චේරිය ස්ථානයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 ක්වූ ජූලි මස 22 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

වෂී 1962 ක්වූ මැයි මස 31 දින,
කොළඹ කච්චේරියේ දීය.

6-480

---

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත "460 වැනි පරිච්ඡේදය"

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්ඩී/ඒ. 51 සහ 63.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ "460 වැනි පරිච්ඡේදය" 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම පළාත් ආණ්ඩු සභාවේ මායිම් තුළ, පළාත් ආණ්ඩු සභා කොට්ඨාශ අංක 4 "f්‍රැන්ක් ලන්ඩ්ස්" සහ පළාත් ආණ්ඩු සභා කොට්ඨාශ අංක 5 "නාරන්දන්ඩ", වත්තේගම "කොටස" පිහිටි වරිපනම් අංක 10/1, නාරන්දන්ඩ මාවතෙහි f්‍රැන්ක්ලන්ඩ් වත්තෙන් ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 2, පර්චස් 14.1ක්වූ මූලික සිතියම් අංක ඒ. 2843 හි කැබලි අංක 1, 2 සහ 3 වශයෙන් මැන විස්තර කරන ලද, වත්තේගම, දොන් උපාලි සමරදිවාකර, ගම්පහ වෙදමහතා විසින් අයිතිවාසිකම් කියනු ලබන එකට යාබද්වූ ඉඩම් කැබලි 3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1962 ජූලි මස 16 වැනි දින පූ. භා. 11ට මහනුවර දිසාපති කායඨාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ජූලි මස 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණයන් සම්බන්ධවද ඇති ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

පී. එච්. ප්‍රේමවර්ධන,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1962ක්වූ ජූනි මස 1 වැනි දින,
මහනුවර කච්චේරිය.

6-471

---

## 1954 අඩක 34 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අඩක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අඩකය : 2/11/51/ජී 58/59/ඇල්ජී. 53.

මහාජන කායඨයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අඩක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කරගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පී. පී. ඒ. 2900—කඩදොරපිටිය ඉහලගම, උඩපනේ කෝරළේ කොත්මලේ ආදායම් නිලධාරි කොට්ඨාශය, නුවරඑළිය දිස්ත්‍රික්කය

**ලොට් නො : 2.**

ඉඩමේ නම : ෂීන්වත්ත ; විස්තර : අවුරුදු 30 කට අධික තේ, ඇලක කොටසක් තිබේ ; අයිතිකරුගෙ නම : සීමාසහිත පුත්ඛලුඹය තේ වතු සමාගම, (ඒජන්තවරු : ජෝර්ජ් ස්ටුවට් සහ සමාගම කොළඹ) ; ප්‍රමාණය : අ. 2, රූ. 2, ප. 31.9.

**එකතුව : අ. 2, රූ. 2, ප. 31.9.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 ජූලි මස 11 දින උදේ 9 ට නුවරඑළිය කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 ජූලි 4 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි. ඉඩම් මට අයිතිය සහ වන්දි මුදල් සම්බන්ධව සියලුම ඔප්පු සහ ලියකියවිලි විභාගයකින් දී මා වෙත ඉදිරිපත් කල යුතුයි.

කේ. රවි. රාජ්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි,
නුවරඑළිය.

නුවරඑළිය කච්චේරිය,
1962 මැයි මස 28 දාය.

6-308

## ඉඩම් අත්කර ගැනීමේ පනත (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වෙනි පරිච්ඡේදයේ)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: එල්.බී/2458 ජේ 59/60/ඇල්. 575.

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වෙනි පරිච්ඡේදයේ) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගන්නා ලද ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,933 දරණ මූලික සැලැස්ම

පහත සඳහන් අංක 1, 3, 4 සහ 5 දරණ ඉඩම් කැබලි මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ උනින් දූවෙල නමැති ගමේ ද, අංක 2 දරණ බිම් කැබැල්ල මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ පහළ ගනේගම නමැති ගමේ ද පිහිටා තිබේ.

**කැබැලි අංකය : 1.**

ඉඩමේ නම: මිතුරෝකන්ද; ඉඩමේ විස්තර: පොල් ගස් 2යි, අවුරුදු 5ක් පමණ වයස් වේ. පුවක් ගස් 9ක් සහිත ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: තෙලිජ්ජවිල පහළගනේගම පදිංචි එච්. එස්. පොඩිඅප්පුහාමි සහ එච්. ඒ. ප්‍රැන්සිස්; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.9.

**කැබැලි අංකය : 2.**

ඉඩමේ නම: මීගහකැටිය; ඉඩමේ විස්තර: අවුරුදු 5-8 දක්වා වූ පොල් ගස් 8 ද, පුවක් ගස් 25 ක් ද, කොස් ගස් එකක් ද, දෙල් ගස් 3 ක් ද, නැදුන් ගස් එකක් ද සහිත ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: තෙලිජ්ජවිල පහළගනේගම පදිංචි එච්. එස්. පොඩිඅප්පුහාමි සහ එච්. ඒ. ප්‍රැන්සිස්; ප්‍රමාණය: අ. 0, රූ. 0 ප. 06.5.

**කැබැලි අංකය : 3.**

ඉඩමේ නම: මීගහකැටිය; ඉඩමේ විස්තර: අවුරුදු 12ක් වූ පොල් ගස් 1 ද, අවුරුදු 5ක් වූ පුවක් ගසක් සහ මාර්ගයක් ඇලකින් කොටසක් ද සහිත ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: තෙලිජ්ජවිල පහළගනේගම පදිංචි එච්. එස්. පොඩිඅප්පුහාමි සහ එච්. ඒ. ප්‍රැන්සිස්; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 09.0.

**කැබැලි අංකය : 4.**

ඉඩමේ නම: මිතුරෝකන්ද; ඉඩමේ විස්තර: අවුරුදු 40ක් වූ පොල් ගස් එකක් ද, අවුරුදු 5-8ක් වූ පුවක් ගස් 9ක් ද සහිත ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: තෙලිජ්ජවිල පහළ ගනේගම පදිංචි එච්. එස්. පොඩිඅප්පුහාමි සහ එච්. ඒ. ප්‍රැන්සිස්; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.7.

**කැබැලි අංකය : 5.**

ඉඩමේ නම: ඉමිතුරෝකන්ද; ඉඩමේ විස්තර: (වැවිලි රහිත) ඉඩම් කොටසක්; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: තෙලිජ්ජවිල උනින් දූවෙල කේ. ඇම්. ලොකුහාමි; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.8.

**එකතුව: අ. 0, රූ. 0, ප. 21.9.**

අත්කර ගන්නා ලද ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 ජූලි මස 16 වෙනි දින සවස 3ට මාතර කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඔවුන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලයලත් නියෝජිතයින් ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 ජූලි මස 10 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ඔප්පු තිරප්පු හා අනිකුත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රා. සී. පීටර්ස්,
ඉඩම් රජයට අත්කර ගැනීමේ නිලධාරී,
මාතර.

1962 මැයි මස 29 වෙනි දින,
මාතර කච්චේරිය.

6-365a

## ඉඩම් අත්කර ගැනීමේ පනත (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වෙනි පරිච්ඡේදයේ)

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

සඳහන් අංකය: එල්.බී/2457/ජේ/59/60 එල්. 541.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ආණ්ඩුව අත්කර ගෙන ඇති බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 460 වෙනි පරිච්ඡේදයේ (7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අත්කර ගෙන ඇති ඉඩම්වල විස්තර:—

අංක ඒ 1,949 දරන මූලික සැලැස්ම

**කැබැලි අංකය : 1.**

ඉඩමේ නම: ඒකල, කප්පරතොට පාරේ වරිපනම් අංක 118න් කොටසක්; ඉඩමේ විස්තර: දෙනිය; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: වැලිගම, කප්පරතොට පදිංචි ඒ. ඩබ්ලිව්. ජෝතිපාල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 07.4.

**කැබැලි අංකය : 2.**

ඉඩමේ නම: කෝදුරුදෙනිය, කප්පරතොට පාරේ වරිපනම් අංක 153/1 කොටසක්; ඉඩමේ විස්තර: අවුරුදු 50 ක්වූ පොල් ගස් 25ක් සහිත ඉඩම; හිමිකම් කියනන්ගේ නම් හා ලිපින: වැලිගම පළාත් ආණ්ඩු සභාව සහ වැලිගම කප්පරතොට පදිංචි ඇල්. ජෝන් සිල්වා, ඇස්. ඊ. ද සිල්වා, පර්සි වයිටස් ද සිල්වා සහ ඇල්. පර්සි වයිටස් සිල්වා; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 28.0.

**කැබැලි අංකය : 3.**

ඉඩමේ නම: තනිගහවත්ත, කප්පරතොට පාරේ වරිපනම් අංක 153/1 කොටසක්; ඉඩමේ විස්තර: අවුරුදු 50ක්වූ පොල් ගස් 47ක් ද, අවුරුදු 40ක් වූ දෙල් ගසක් ද සහිත පොල් ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: වැලිගම කප්පරතොට පදිංචි ජේ. ඒ. විජේතෝව, ඇම්. ඇස්. ජයවීර, ඇම්. විජේතෝවා සහ වැලිගම මහ විදියේ ඩබ්ලිව්. එච්. ජෝන් සිල්වා; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 15.6.

**එකතුව: අ. 0, රූ. 3, ප. 11.0.**

ඉහත සඳහන් ඉඩම් කැබලි තුනෙන් අංක 1 දරණ ඉඩම් කැබැල්ල මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ වැලිගම පළාත් ආණ්ඩු සභා සීමාව තුළ අංක 7 වල්ලිවල ඡන්ද කොට්ඨාශයේ වලිලිවල ගමේ ද අංක 2 සහ 3 දරණ ඉඩම් කැබලි මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ වැලිගම පළාත් ආණ්ඩු සභා සීමාව තුළ අංක 1 කප්පරතොට ඡන්ද කොට්ඨාශයේ කප්පරතොට ගමේ ද පිහිටා තිබේ.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ජූලි මස 18 වැනි දින උදේ 10 ට වැලිගම තානායමේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් ඔවුන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයින් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

මේ සම්බන්ධ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු තිරප්පු හා අනිකුත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යි.

ප්‍රා. සී. පීටර්ස්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
මාතර.

1962 මැයි මස 29 වෙනි දින,
මාතර කච්චේරිය.

6-370

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: එල්.බී. 2406/ජේ 58/59 ඊ 335.

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වෙනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

අංක 573 දරණ අවසාන ගම් සිතියමේ 4 වෙනි අතිරේකය.

**ඉඩමේ අංකය : 181.**

ඉඩමේ නම: බෝගහහේන; ඉඩමේ විස්තරය: අවුරුදු 10-30 වයසැති කොස් ගස් 5 ක්, අවු. 30 ට අධික ගොරක ගස් 4 ක්, අවු. 5-10 වයසැති අඹ ගස් 2 ක්, අවු. 5-10 වයසැති කිතුල් ගස්

3 ක්, අවු. 15-20 වයසැති රබර් ගස් 63 ක්, අවු. 30 ට පැරණි පැඟිරි වැවිල්ලක්, බැම්මෙන් බදින ලද උළු සෙවිලි පාසැල් ගොඩනැගිල්ලක්, මැටියෙන් සාදන ලද අතු සෙවිලි තාවකාලික පාසැල් ගොඩනැගිල්ලක් සහ බැම්මෙන් බදින ලද බෝ කොටුවක් සහිත ඉඩම; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපින: හක්මන, කෝන්ගල, ඩාර්ලිස් ද සිල්වා ජයසිංහ; කඹුරුපිටියේ, කොරඹුරුවානෝ, ගම්පල ගමගේ චාර්ලිස්; මෝදරවානෝ, පල්ලේවාව්වේ, සුන්දරප්පෙරුම පතිරනගේ ඩැනී; පුහුල්වැල්ලේ, ගල්කන්ද කොණ්ඩමුල්ලේ, ගජනායක මුදලිගේ හීන් අප්පුහාමි, අත්තනායක බොරාලගේ ඩිංගි අප්පුහාමි, කෝන්ගල් බොරාලගේ බබාහාමි, කෝන්ගල බෝරාලගේ බාර්නිස් අප්පුහාමි, පනන්වල රළුවගේ සවුන් අප්පුහාමි සහ පනන්වල රළුවගේ කළු අප්පුහාමි; බිම් ප්‍රමාණය: අ. 2, රූ. 0, ප. 0.

ඉහත සඳහන් ඉඩම් මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුවේ, කිරින්ද ගමේ පිහිටා තිබේ.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 ජූලි මස 20 වෙනි දින පෙරවරු 10 ට හක්මන ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලයේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 ජූලි 7 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ඉහත කී ලෙස බලයලත් අය හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තවද, තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට අවශ්‍ය ඔප්පු තිරප්පු හා අනිත් ලියවිලි ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ෆ්‍රා. සි. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ උප දිසාපති.

මාතර කච්චේරිය.
1962 ජූනි මස 1 දය.

6-470

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතේ සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ආඥපනත

### 4 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

යොමු අංකය ඒ.කප්‍ර/27

මෙහි පහත දැක්වෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බැවින් එම ඉඩම ආණ්ඩුවට ගැනීමට අදහස් කරන බැව් 1950 හේ අංක 9 දරණ ඉඩම් ආණ්ඩුවට ලබාගැනීමේ ආඥාපනතේ 4 වෙනි ඡේදයේ හා 1954 අංක 39 දරණ ඉඩම් සංශෝධන පනතේ විධි විධානවල ප්‍රකාර අනුව කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ගරු ඇමති තුමාගෙන් අන ලැබී තිබෙන බැව් මෙයින් දැනුම් දී සිටිමි.

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ආදායම් පාලක නැනගේ කොට්ඨාශයේ තලෙයිමන්නාරම ගම්මුලාදැනි කොට්ඨාශයේ පිහිටි අක්කර 12 රූඩ් 2 පර්චස් 00 පමණ ප්‍රමාණයෙන් යුත් ඉඩම, ඊට මායිම් මෙසේ ය:—

උතුරට: එම ඉඩමේ ඉතුරු කොටස; නැගෙනහිරට: එම ඉඩමේ ඉතුරු කොටස; දකුණට: පල්ලිය, පාසැල හා අන්තෝනිපිල්ලෙයි කුඤ්ඤුට අයිති දේපල; බස්නාහිරට: මුහුදු වෙරළ හා වැලි පොළව.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් ඇති අය විසින් එම ඉඩම ආණ්ඩුවට ගැනීමට විරුද්ධව කියන්නට තිබෙන කරුණු 1962 ජූනි මස 30 වෙනි දිනට ප්‍රථමයෙන් කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මහතා නමට ලියා යැවිය යුතුයි. එසේ ලියා යවන ලිපියෙහි කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමැති කාර්යාංශයේ අංක ජේ. 61/62 ඇල්. 225 (වීර්) නැමැති අංකය සම්බන්ධයෙන් යැයි සඳහන් කළ යුතුවෙයි.

ඇන්. පී. ජෙගනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තුමා.

1962 ක්වූ මැයි මස 30 වෙනි දින,
මන්නාරම කච්චේරියේ දී ය.

6-465

---

## ව්‍යවස්ථාපිත අණපනත්වල ප්‍රතිශෝධිත මුද්‍රණය 1956 ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය) 33 වන වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ඇල්ඒ. 3750.

පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති තැන්පත් ආර්. පාස්කරලිංගම් වන මම, මෙහි පහත උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම රජයට අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල වශයෙන් රුපියල් 651 ක් රජයට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වන වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික් උසාවියට ගෙවා ඇති බව මෙයින් දන්වමි. එම මුදලට හිමි අයිතිවාසිකම් ඇති අය විසින් උසාවිය වෙත ඉල්ලුම්කර මුදල් ලබාගත යුතුය. මීට සම්බන්ධ හලාවත දිස්ත්‍රික් උසාවියේ නඩු නොම්මරය 331/එස්පීඑල්. වේ.

ආර්. පාස්කරලිංගම්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති.

1962 මැයි මස 30 වන දින,
පුත්තලම් කච්චේරියේදීය.

### උපලේඛනය

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුව, පහල කොස්වාඩිය පිහිටි, ඒ 1712 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 1, 2 සහ 4 වශයෙන් විස්තර කර ඇති, ප්‍රමාණය පිළිවෙලින් පර්චස් 3.9, පර්චස් 4.7 සහ රූඩ් 1 පර්චස් 25.8ක් වූ, පොල්ගහගාල, පොල්ගහගාල සහ දිවුල්ගහවත්ත නමැති ඉඩම් කැබලි තුන.

6-389

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මගේ අංකය: ඇල් කිච්/ඒ 10.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

පොලොන්නරුවේ, සිංහල පත්තුවේ, තමන්කඩුවේ, තිඹිරිගස්වැව ගම අවසාන ගම්සිතියම් නොම්මර 883 නෝ අංක 1 දරණ අතිරේක සැලැස්ම

කැබලි අංකය: 47.

ඉඩමේ නම: දඹගහකුඹුර; විස්තර: මඩ කුඹුර (අත්හැර දමන ලද); අයිතිකම් කියන අය: හබරන, තිඹිරිගස්වැව පදිංචි රංහාමිගේ තිත්තම්මා, සෙල්ලවන්තිහාමිගේ රංහාමි, කීරාලගේ බංඩා, සෙල්ලාතගේ කිරිබංඩා, අප්පුහාමිගේ සේනානායක, පුංචිරාලගේ උක්කුබංඩා, වෙලාතගේ කපුරාල, කව්රාලගේ පුංචිමැනිකා සහ සෙල්ලවන්තිගේ රංහාමි, දඹුල්ලේ තිත්තවැල්ගොල්ලේ මැණික් රාලගේ රන්බන්ඩා, පොලොන්නරුවේ පලුගස්දමන නො. 235හේ පදිංචි කපුරුහාමිගේ මුදියන්සේ, පොලොන්නරුවේ අලුත්වැව පුංචිරාලගේ සිම්බුරාල, මනම්පිටියේ කිරලැස්ස මැනික්රාලගේ තිමබන්ඩා සහ හබරන දුම්රියපොලේ මුදියන්සේගේ ලීලාවති; ප්‍රමාණය: අ. 3, රූ. 3, ප. 12.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ජූලි මස 14 වැනි දින පූ. භා. 11 ට හබරන තානායම් පොලේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ජූලි මස 7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
ආණ්ඩුවේ ඒජන්තතැන.

1962 මැයි මස 30 වැනි දින,
පොලොන්නරුවේ කච්චේරිය.

6—349

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

මගේ අංකය: ඇල් 7713.
දිසාපතිගේ අංකය: ඇල් ඩබ්ලිව් 882.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කොළඹ නගර සීමාවතුල කුප්පියාවත්ත කොට්ඨාශයේ පිහිටි අංක 4 දරණ රජයේ ඉඩම් සැලැස්මේ අංක 1 දරණ ආණ්ඩුවේ බිම් කට්ටියෙන් පර්චස් 20ක් පමණ වූ රජයේ ඉඩම් කොටසක්, දිවංගත අගමැති, ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා සිහිවීම් වශ. මහජන පුස්තකාලයක් සහ කියවීම් ශාලාවක් පිහිටුවීම සඳහා කොළඹ බේස්ලයින් මාවතේ ශ්‍රී සුචරිතෝදය සංගමයේ භාරකරුවන් වන පූජ්‍ය පණ්ඩිත කිරිවත්දෙනියේ වජිරවංශ ස්ථවිරයන් වහන්සේ සහ ජයවීර කුරුප්පු සහ වෝල්ටර් විමලචන්ද්‍ර යන මහත්වරු බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම ආයතනය පූජ්‍ය පක්ෂයට මෙන්ම ගිහි පක්ෂයටද එක සේ විවෘත වන බවට සහ බාල පරම්පරාවේ සංස්කෘතික දියුණුවට කටයුතු කරන බවට කරුණු දක්වා ඇත. ඉඩම අවශ්‍ය කාරණයට දීමට තිබේ. සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට එම ඉඩම බදු දීමට යෝජනා කර ඇත:—

(ඒ) කාලය: අවුරුදු 10 යි.

(බී) බද්ද: අවුරුද්දකට රු. 100 යි.

(සී) බදු කරුවන් විසින් බද්ද ආරම්භයේ සිට අවුරුද්දක් ඇතුලත කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ සිත් ගන්නා පරිද්දෙන්, එකී ඉඩමෙහි මෙකී කාරණය සඳහා අවශ්‍ය ගොඩනැගිලි, ආණ්ඩුවේ නගර නිර්මාන ශිල්පියා සහ ප්‍රසිද්ධ වැඩ අධ්‍යක්ෂක තැන විසින් කලින් අනුමත කරනු ලැබූ සැලැස්මක් අනුව, සාදා නිමකළ යුතුය.

(ඩී) බදුගන්නන් විසින් මෙම ඉඩම මහජන පුස්තකාලයක් සහ කියවීම් ශාලාවක් පිහිටුවීම පිණිස මිස වෙන කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1962 ජූනි මස 8 වෙනි දින.

6-418

---

## නිවැරදි කිරීමයි

1962 මැයි මස 25 වැනි දින අංක 13,134 දරණ ගැසට් පත්‍රයේ III වැනි කොටසේ 309 වැනි පිටුවේ ඉඩම් කොමසාරිස්ගේ අංක එල්. කේ. 1350 සහ දිසාපතිගේ අංක එල්. ඒ. 4331 දැක්වෙන අංක 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ පලවී ඇති නිවේදනයේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල රු. 550/- නොව රු. 500/- ලෙස නිවැරදි විය යුතුයි.

5-845

**සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3. 30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලච්චේනායෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හී නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි